රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2004

මගේ අංකය : ආ9/3/98
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2004.06.15 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/
රජය සතු සමාගම් සභාපතිවරුන් වෙත.

## 2001 දෙසැම්බර් සිට 2004 අප්‍රේල් දක්වා
## <u>දේශපාලන පළිගැනීම්</u>

2001 දෙසැම්බර් මස සිට 2004 අප්‍රේල් දක්වා කාලය තුළ පත්වීම්, උසස්වීම් සහ ස්ථානමාරු කිරීම් ආදී කටයුතුවල දී දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ගේ පැමිණිලි පරීක්ෂා කර දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් ලෙස තහවුරු වන අයට සහන සැලසීම සඳහා නිර්දේශ කිරීමට එක් එක් අමාත්‍යාංශ මට්ටමින් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් දේශපාලන පළිගැනීම් විමර්ශන කමිටු පිහිටවිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් තීරණය කර ඇත.

02. මෙම කමිටුවට අදාල අමාත්‍යාංශය භාර අමාත්‍යතුමා විසින් තෝරා ගනු ලබන තවද සාමාජිකයින් දෙදෙනෙකු ඇතුලත් විය යුතු අතර, ඉන් එක් අයෙකු නීතිඥවරයෙකු විය යුතුය. අදාල අමාත්‍යාංශය හා එය යටතේ ඇති දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජය සතු සමාගම්වල සේවයේ නියුතු වූවන් විසින් ඉදිරිපත් කරනු ලබන දේශපාලන පළිගැනීම් පිළිබඳ පැමිණිලි විභාග කර අදාල අමාත්‍යතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ කාර්යභාරය මේ කමිටුවලට පැවරේ.

03. දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් පැමිණිල්ලට පදනම් වූ චෝදනා සහ හේතුන් සඳහන් කරමින් එය තහවුරු කිරීමට පදනම් කර ගනු ලබන ලියවිලි වෙතොත් ඒවාද සමග, අපේක්ෂිත සහනය හෝ ප්‍රතිකර්ම ද සඳහන් කරමින්, දේශපාලන පළිගැනීම් විමර්ශන කමිටුව වෙත ලිඛිත පැමිණිල්ලක්/ අභියාචනයක් මාසයක් ඇතුලත ඉදිරිපත් කරන ලෙස නිවේදනයක් මගින් හෝ අමාත්‍යාංශ චක්‍රලේඛයක් මගින් අදාල සේවයේ නියුතුවූවන් වෙත දැන්වීමට දේශපාලන පළිගැනීම් විමර්ශන කමිටුව ක්‍රියා කළයුතුය. පැමිණිලිකරුවෙකුට ඉදිරිපත් කළහැකි පැමිණිල්ලේ/ අයදුම්පත්‍රයේ ආදර්ශයක් ඇමුණුම -1 හි ඇත. කමිටුවට ලැබෙන පැමිණිලි/ අභියාචනා විභාග කොට, දේශපාලන පළිගැනීමක් සිදු වී ඇතැයි කමිටුවට තහවුරු වන අය සම්බන්ධයෙන්, කමිටුවේ තීරණ සහ නිර්දේශ කරනු ලබන සහනද, ඊට හේතු ද සහිත වාර්තා පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින්, <u>මාස තුනක් (03) ඇතුලත</u> සිය අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කළයුතු වේ.

(අ) <u>දෙපාර්තමේන්තු ප්‍රධානීන් හැර, අමාත්‍යාංශය සහ එය යටතේ ඇති දෙපාර්තමේන්තුවල රජයේ නිලධාරීන්:-</u>
මොවුන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, මාරුකිරීම් හා විනයපාලනය ආදී කටයුතු පිළිබඳ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇත. එබැවින් දේශපාලන පළිගැනීමකට ලක් වූ බවට තහවුරු කෙරෙන යම් නිලධාරියෙකුට කමිටුව විසින් පත්කිරීමක්, උසස්කිරීමක්, මාරුකිරීමක්, විනය චෝදනාවලින් නිදහස් කිරීමක් වැනි සහනයක් නිර්දේශ කරන්නේ නම්, එවැනි නිර්දේශයන්

අමාත්‍යතුමා වෙත වෙනම ඉදිරිපත් කළයුතු අතර, එම වාර්තා නිසි කටයුතු සඳහා සලකා බැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට අමාත්‍ය මණ්ඩලයට හැකිවේ.

එසේ නොමැතිව, දේශපාලන පලිගැනීමක් සිදු වී යයි තහවුරු වන අයෙකුට මූල්‍යමය වන්දියක් පමණක් කම්ටුව නිර්දේශ කරන්නේ නම්, එම නිර්දේශ වෙනම ඉදිරිපත් කළයුතු වේ. එවැනි නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු නොකොටම, අමාත්‍ය මණ්ඩලයට සුදුසු තීරණ ගතහැකිවේ.

(ආ) <u>දෙපාර්තමේන්තු ප්‍රධානීන්:-</u>

මොවුන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය ආදී කටයුතු පිළිබඳ බලය අමාත්‍ය මණ්ඩලය සතු වන අතර, අමාත්‍ය මණ්ඩලය විසින් ඒ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදහස් විමසා දැනගැනීමෙන් පසු ක්‍රියාවේ යොදවනු ලැබිය හැක. එබැවින් මොවුන්ගෙන් ලැබෙන දේශපාලන පලිගැනීම් පිළිබඳ පැමිණිලි/ අභියාචනා විභාග කොට, නිර්දේශ කරනු ලබන සහන පිළිබඳ වාර්තා, සිය නිර්දේශ ද සහිතව අමාත්‍ය මණ්ඩලයට සුදුසු තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කළහැකි වනු පිණිස අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළයුතුය.

(ඇ) <u>රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජය සතු සමාගම්වල සේවයේ නියුතු වූවන් :-</u>

මෙම ආයතනවල සේවයේ නියුතු වූවන්ගේ දේශපාලන පලිගැනීම්වලට අදාල පැමිණිලි/ අභියාචනා විභාග කොට, දේශපාලන පලිගැනීමක් සිදු වී ඇති බවට තහවුරු වන අය සම්බන්ධයෙන් නිර්දේශ කරනු ලබන සහන පිළිබඳ වාර්තා, සිය නිර්දේශද සහිතව අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කළහැකි වනු පිණිස, අදාල අමාත්‍යතුමා වෙත යොමු කළයුතු වේ. අමාත්‍ය මණ්ඩලය විසින් මේවා සලකා බලා සිය නිර්දේශයන් අවශ්‍ය කටයුතු සඳහා අදාල ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල / කොමිෂන් සභා වෙත යොමු කිරීමට තීරණය කරනු ඇත.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතනවලටද මෙම නියමයන් අදල වන අතර,එවැනි වාර්තා අදල කොමිෂන් සභා වෙත ඉදිරිපත් කළයුතු වේ. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත 41 ආ ව්‍යවස්ථාවේ දැක්වෙන උපලේඛනයේ ඇතුලත් කොමිෂන් සභා මින් බැහැර වේ.

(ඈ) <u>පොලිස් නිලධාරීන්:-</u>

ඉහත 3 (අ) යටතේ පැහැදිලි කළ ආකාරයට පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් අදල කමිටු නිර්දේශ ජාතික පොලිස් කොමිෂන් සභාවේ සැලකිල්ල සඳහා යොමු කළයුතුවේ. මෙහි දී 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ XVIII අ පරිච්ජේදයේ විධිවිධාන අදල වේ.

විකල්පයක් වශයෙන් මූල්‍යමය වන්දියක් පමණක් ගෙවීමට කරනු ලබන කමිටු නිර්දේශ ජාතික පොලිස් කොමිෂන් සභාවට යොමු නොකොටම අමාත්‍යාංශයට සුදුසු තීරණ ගැනීමට හැකිවනු පිණිස වෙනම ඉදිරිපත් කළයුතුය.

04. දේශපාලන පලිගැනීම් යටතේ, දේශපාලන හේතූන් මත (අ) නිලයෙන් පහ කිරීම (ආ) උසස්වීම් අහිමි කිරීම (ඇ) තනතුරෙන් පහත දැමීම (ඈ) ස්ථාන මාරු කිරීම (ඉ)විනයානුකූලව කටයුතු කිරීම (ඊ) රැකියාවේ තත්ත්වය, වරප්‍රසාද, හා පහසුකම් පහත හෙළීම වැනි කරුණු

ආවරණය වේ. සේවා ස්ථානයට ඇතුළුවීමට ඉඩ දී නොමැති සේවකයන්ට සහන සැලසීමද කමිටු විසින් සලකා බැලිය යුතුය.

**05.** දේශපාලන පලිගැනීමක් සිදු වී තිබේ ද යන්න නිශ්චය කිරීමේ දී කමිටුවට පහත සඳහන් කරුණු සැලකිල්ලට ගතහැක.

I පැමිණිලිකරු සේවය කර ඇති අවුරුදු ගණන

II පැමිණිලිකරුගේ සේවයේ ස්වභාවය

III පලිගැනීම ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිඛිත සාක්ෂි ඇතුලත් වෙනත් සාක්ෂිවල අදාලකම

IV එම පලිගැනීම ඔප්පු කිරීම සඳහා ආධාර කරගතහැකි ලියවිලි ලබාගැනීමට නොහැකි නම් ඊට හේතු

V එම පලිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී ඇති මූල්‍යමය හා පෞද්ගලික අලාභ

VI එම පලිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් අයෙකුට විශේෂිතව ලැබී ඇති මූල්‍ය සහ පෞද්ගලික වාසි

**06.** පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය අදාල නොවේ. ඔවුන් පිළිබඳව ආණ්ඩුකාරවරුන් විසින් සුදුසු විධිවිධාන යොදනු ලබනු ඇත.



එස්.සී. මාන්නප්පෙරුම

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

# අයදුම්පත

## දේශපාලන පලිගැනීම් පිළිබඳ පැමිණිල්ල

01. පැමිණිලිකරුගේ නම :

02. ලිපිනය (අ) කාර්යාලය : දුරකථන අංකය :

(ආ) පුද්ගලික : දුරකථන අංකය :

03. උපන් දිනය : වයස :

04. ඔබගේ සේවය, තනතුර හා කාලය ( දින සමග) :

05. (I) දේශපාලන පලිගැනීමේ ස්වභාවය :-

(කවර වර්ගයට අයත් ද?)

උදා:

අ. නිලයෙන් පහ කිරීම

ආ. උසස්වීම අහිමි කිරීම

ඇ. තනතුරින් පහත දැමීම

ඈ. ස්ථාන මාරු කිරීම

ඉ. විනයානුකූලව කටයුතු කිරීම

ඊ. රැකියාවේ තත්වය, වරප්‍රසාද හා පහසුකම් පහත හෙළීම

(II) පැමිණිලි කරනු ලබන දේශපාලන පලිගැනීම සිදු කළ වර්ෂය හා මාසය :

06. සිදු කරන ලද අසාධාරණය සනාථ කිරීමට අදාල තොරතුරු කෙටියෙන් සඳහන් කරන්න.

07. ඉහත සඳහන් දේශපාලන පලිගැනීම පැහැදිලි කරගැනීමට උදව් කරගත් ලියවිලි මොනවාද?

08. ඉහත 7 හි සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ නොහැකි නම් ඊට හේතු කවරේද?

09. මෙම පලිගැනීම නිසා යම් මූල්‍යමය හෝ වෙනත් පාඩුවක් වී නම් කෙටියෙන් සඳහන් කරන්න.

10. I මේ සම්බන්ධයෙන් කලින් ඔබ අධිකරණයට, යම් විනිශ්චය සභාවකට හෝ මහජන පෙත්සම් කාරක සභාවට පැමිණිලි කර තිබේද?

II පිළිතුරු "ඔව්" නම් පහත සඳහන් තොරතුරු සපයන්න.

I උසාවියේ හෝ විනිශ්චය සභාවේ නම :

II පැමිණිලි කළ දිනය හා පැමිණිලි අංක :

III උසාවියේ, විනිශ්චය සභාවේ හෝ මහජන පෙත්සම්කාරක සභාවේ තීරණය හා දිනය :

11. (අ) මේ සම්බන්ධයෙන් ඉහත දී ඔබ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට/ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියට අභියාචනා කර තිබේ ද?

(ආ) පිළිතුර "ඔව්" නම් තීරණයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.

12. ඔබ පැමිණිලි කරනු ලබන මෙම දේශපාලන පලිගැනීම සම්බන්ධයෙන් ඉල්ලා සිටින සහන කවරේ ද?

ඉහත කරුණු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි.

දිනය : අයදුම්කරුගේ අත්සන